නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මිනිපේ

வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – மினிப்பே

Resident Project Management Office – Minipe

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division

මොරයාය
මිනිපේ

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

மொரயாய
மினிப்பே
Morayaya
Minipe

මගේ අංකය / எனது இல. / My Ref No
ඔබේ අංකය / உமது இல. / Your Ref No
දිනය / திகதி / Date 2018/02/ 27

## 2018 පෙබරවාරි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්ථාව

ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය , මොරයාය.
දිනය - 2018/ 02 / 27.
වේලාව - පෙ.ව 9.30

ආගම සිහි කිරීම සහ ව්‍යාපාරයේ නිර්මාතෘන් හා මියගිය ගොවි නායකයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවකින් අනතුරුව,
2018 වසරේ පවත්වනු ලබන ප්‍රථම ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම බවත් 2018 නව වසරට සුභාශිංෂණය ගෙන එමින් ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපාර කළමනාකරණ කමිටුව පැවැත්වීමේ ප්‍රධාන අරමුණු ලෙස,

* 2017/18 මාස් කන්නය දැනට පවතින වගා තත්වයන් පිළිබඳව සාකච්ඡා කිරීම.
* 2018 යල කන්නය පිළිබඳව සාකච්ඡා කිරීම.
* CRIP වැඩසටහන පිළිබඳව වාරිමාර්ග දෙපාර්තාමේන්තුවේ අදහස් විමසීම.
* PEISEIP - කෙත් ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීම.
* මිණිපේ ප්‍රධාන ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනය කිරීම.

ආදිය පිළිබඳ සාකච්ඡා කිරීමට නියමිත බවත් 2017/2018 මාස් කන්නය සඳහා 3සහ 4 පියවරයන්ට මාර්තු 02
සහ 1 සහ 2 පියවර සඳහා මාර්තු 17 වන විට අවසන් ජල මුරය නිකුත් කරන බවත් කුමන ආකාරයකින් හෝ ජල මුර දීර්ඝ කිරීමකට යා නොහැකි බවත් පවසමින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන CRIP - දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම , අවශ්‍ය කාලය ලබා දිය යුතු බැවින් ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියා මාර්ග ගතයුතු බව ප්‍රකාශ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2018 වසරේ ආරම්භ කර 2019 මාර්තු මස වන විට සියළු කටයුතු අවසන් කළයුතු බවත් දන්වා සිටිමින් 2018 යල කන්නය පිළිබඳ නිවැරදි තීන්දු තීරණ ගත යුත්තේ ගොවි සංවිධාන විසින් බැවින් මෙම අවස්ථාව තීරණාත්මක අවස්ථාවක් බව දන්වා සිටින ලදී.

PEISEIP - කෙත් ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් මෙම වසර තුළ මිණිපේ ව්‍යාපාරයට ලැබී ඇති බවත් , වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වාරි කළමනාකරණ අංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතන ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවත් , එහිදී තෝරාගත් කෙත් ඇල අංග සම්පූර්ණව සංවර්ධනය කරගැනීමේ හැකියාව ඇති බව ප්‍රකාශ කරමින් ඒ සඳහා ද අවශ්‍ය කාලය ලබා දිය යුතු බව දන්වා සිටින ලදී.

ඉදිරියේදී පෙර කන්න රැස්වීම් පැවැත්වීමට නියමිත බැවින් එදිනට මේ සම්බන්ධව සියලු තීන්දු තීරණ ගත යුතු බව ප්‍රකාශ කරමින් මිණිපේ අමුණ ඉස්සීමේ අධ්‍යක්ෂතුමාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

| | |
|---|---|
| මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘති අධ්‍යක්ෂ මැදිවක මහතා | මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය පැකේජ 04කට අනුව ක්‍රියාත්මක කරන බවත් ඒවායේ කොන්ත්‍රාත් සමාගම් භාර කොන්ත්‍රාත්කරුවන් මෙම අවස්ථාවට සහභාගී වී ඇති බව ප්‍රකාශ කරමින් මෙතෙක් අමුණ ඉස්සීමේ ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනයක් සිදු කරන ලදී. ඒ අනුව 1 සහ 2 පියවර තුළ යම් ආකාරයක ප්‍රගතියක් පෙන්නුම් කරන නමුත් 3 පියවර තුළ යම් ප්‍රමාණයක ප්‍රගතියේ අවම බවක් දක්නට ලැබෙන බවත් 4 පියවර භාරව කටයුතු කළ කොන්ත්‍රාත් සමාගම විසින් එය ඉතා හොඳින් සිදුකර ඇති බවත් මෙම වර්ෂයේදී සියළු වැඩ කොටස් නිම කිරීමට හැකියාව පවතින බවත් ප්‍රකාශ කරමින් එම කොන්ත්‍රාත් සමාගමට ස්තූතිය එල කරන ලදී. එසේම ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය හරහා වනවගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් එහි පළමු අදියර ලෙස එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටි සමාගම විසින් 1පියවර ඇල රක්ෂිත ආරක්ෂා කිරීමේ අරමුණින් මොරයාය සංඝබෝධි විද්‍යාලය තුළ දේශීය පැළ ස්ථාපිත කිරීම පසුගිය දිනක පැවැත්වූ බවත් ගොවි සංවිධාන සම්බන්ධ කර ගෙන ඉදිරියේදී එම වැඩ සටහන් කුමන ආකාරයකින් ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබද අදහස් දැක්වීමට ඒ ඒ පියවර භාරව කටයුතු කරන කොන්ත්‍රාත් සමාගම් වෙත අවස්ථාව ලබා දෙන ලදී. |
| 1 පියවර - එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටි සමාගම | 1 පියවර තුළ ඇල රක්ෂිත ආරක්ෂා කිරීම සදහා වන වනවගා ව්‍යාප්තිය සදහා මිලියන 12.45 ක් වෙන්ව ඇති බවත් ඒ සදහා ගොවි සංවිධාන සම්බන්ධ කරගෙන ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන බවත් ,<br>• ඇල රක්ෂිත සම්බන්ධ සීමාවන් තුළ පුවක් වැටියක් යොදන බවත්<br>• රක්ෂිත තුළ දේශීය පැළ සිටුවීමට නියමිත බවත්<br>• එසේම වන වගා සිදු කිරීමට සුදුසු රජයේ ඉඩම් තිබේනම් එම ස්ථාන පෙන්වා දෙන ලෙසත්,<br>මේ සියළු කටයුතු සදහා ගොවි සංවිධාන සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක විමට නියමිත බවත් වන වගාවේ අනාගත පැවැත්ම හා එහි නඩත්තු කටයුතු සම්බන්ධව ගොවි සංවිධාන හා එක්ව ගිවිසුම් ප්‍රකාශයකට යටත්ව එම කටයුතු 2018 ඔක්තෝම්බර් 13 වන දින ආරම්භ කිරීමට කටයුතු යොදන බවත් ප්‍රකාශ කරන ලදී. |
| 2 පියවර කොන්ත්‍රාත් සමාගම | 2 පියවර තුළ ඇල රක්ෂිත ඉඩම් පිළිබද විශාල ගැටළුකාරී තත්ත්වයන් පවතින බවත් ඒ නමුත් හදුනාගත් රක්ෂිත ඉඩම් තුළ පැල සිටුවීමට කටයුතු යොදන බවත් මෙම වන වගාව සදහා 2 පියවරට මිලියන 06ක මුදලක් වෙන් වී ඇති බවත් මෙම මුදල් වියදම් කර වනවගා ස්ථාපිත කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බැවින් එහි ඉදිරි පැවැත්ම පිළිබද කටයුතු යෙදිය යුතු බැවින් ගොවි සංවිධාන සම්බන්ධ කරගෙන සාකච්ඡා සිදු කර යහපත් යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී. |
| 3 පියවර කොන්ත්‍රාත් සමාගම | 3 පියවර වන වගා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගොවි සංවිධාන සම්බන්ධ කර ගනිමින් ඉදිරියේදී කටයුතු කිරීමට සූදානම් බව දන්වා සිටින ලදී. |
| 4 පියවර කොන්ත්‍රාත් සමාගම | 4 පියවර වන වගා ව්‍යාපෘතිය සදහා මිලියන 1.9ක් වෙන්වී ඇති බවත් වන වගාව සම්බන්ධව දැනට රැස්වීම් 2ක් පවත්වා ගොවි සංවිධාන සමග සාකච්ඡා කළ බවත් වන රක්ෂණ දෙපාර්තමේන්තුව හරහා වන වගාවට අවශ්‍ය පැල ලබා ගැනීමට නියමිත බවත් එම පැල ලැබුණ වහාම වන වගා ව්‍යාප්තිය ආරම්භ කිරීමට නියමිත බවත් දන්වා සිටින ලදී. |
| නේ.ව්‍යා.කළමනාකරු | මිණිපේ අමුණ ඉස්සිමේ ව්‍යාපෘතිය මේ වන විට සිදු කර ඇති වැඩ ප්‍රමාණයන් පිලිබදව කළ ප්‍රගතිසමාලෝචනය සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියේ පසුගිය වසර තුළ සිදුකිරීමට නියමිතව තිබූ වැඩ කොටස් වලින් 100%ක් සිදු කිරීමට නොහැකි වී ඇති නමුත් පියවර කිහිපයක කාර්යභාරය සතුටුදායක මට්ටමින් සිදු වී ඇති බවයි. ඉදිරි නියමිත වසර කිහිපය තුළ කළ යුතු කාර්යභාරය නිවැරදිව නිසියාකාරව සිදුකරන්නේ නම් ගොවි ජනතාවට ලබාදිය හැකි ප්‍රතිලාභ මිණිපේ අමුණ ඉස්සිමේ ව්‍යාපෘතියෙන් ලබා ගත හැකි බවත් එසේ නොවුණහොත් කාලය සහ විශාල මහජන මුදලක් අනිසි ලෙස |

| | |
|---|---|
| | විනාශ වී යන බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් ඉදිරි වසර කිහිපය තුළ ව්‍යාපෘතියේ කටයුතු නිසියාකාරව සිදුවෙතැයි අපේක්ෂා කරන බව වැඩිදුරටත් දන්වා සිටින ලදී.<br>එසේම යම් යම් අඩුපාඩු ඇති වුවද විනිවද භාවයකින් යුතු මෙවැනි ව්‍යාපෘතියක් මීට පෙර මිණිපේ ව්‍යාපාරයේ ක්‍රියාත්මක වී නොමැති බවත් ප්‍රකාශ කරමින් ,<br>වසර 07කට වඩා වැඩි කාලයක් මිණිපේ ව්‍යාපාරයේ ගොවි මහතුන් වෙනුවෙන් සේවය කර අද දින ස්ථාන මාරුවීම් ලැබ යන හසලක වාරිමාර්ග කාර්යාලයේ ඉංජිනේරු සහකාර නවරත්න මහතාට එතුමාගේ අදහස් දැක්වීමට අවස්ථාව දෙන ලදී. |
| ඉංජිනේරු සහකාර නවරත්න මහතා | ක්ෂේත්‍ර නිළධාරියකු ලෙස 2011 හසලක වාරිමාර්ග කාර්යාලයට පැමිණ එතැන් පටන් මේ දක්වා මිණිපේ ව්‍යාපාරය තුළ වසර 07ක් වැනි කාලය තුල සේවය කිරීමට ලැබීම පිළිබද තමන් සතුටු වන බවත් මිණිපේ ව්‍යාපාරයේ 1 සහ 4 පියවර තුළ රාජකාරි කටයුතු කරමින් ලැබූ අත්දැකීම් රාජකාරි ජීවිතයට මෙන්ම පෞද්ගලික ජීවිතයටද පන්නරයක් වූ බව ප්‍රකාශ කරන ලදී. එසේම රාජකාරි කටයුතු කිරීමේදී යම් යම් අවස්ථා වල ඇති වූ සිද්ධීන් වලට හේතු වූයේ සියළුදෙනාටම ජලය සමව ලබා දීමට මිස පෞද්ගලික හේතු පදනම්ව නොවන බව දන්වා සිටිමින් 2018 වසර මිණිපේ ජනතාවට ප්‍රතිලාභ රාශියක් ලැබෙන එහෙත් එය තීරණාත්මක වසරක් විය හැකි බවත් එබැවින් මිණිපේ ව්‍යාපාරයට ලැබෙන සියළු ප්‍රතිලාභ මගනොහැරවාගෙන එහි ප්‍රතිඵල භුක්ති විදීමට සියළු දෙනාගේ කැපවීම අවශ්‍ය බව ප්‍රකාශ කරමින් එම සියලු වැඩකටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට සුභ ප්‍රාර්ථනා කරන ලදී. |
| | ඉංජිනේරු සහකාර නවරත්න මහතාගේ ස්ථාන මාරුවීම පිළිබද ඒ.ගො. සං. සභාපති ගමගේ මහතා, 1 පියවර ප්‍රා.ගො. සං. සභාපති සරත් මහතා ,3 පියවර ප්‍රා.ගො.සං. සභාපති උපාලි ජයතිස්ස මහතා, 4 පියවර ප්‍රා.ගො.සං. සභාපති රංජිත් මහතා , ව්‍යාපාර කමිටු ලේකම් ධර්මසේන මහතා යනාදීන් අදහස් දක්වමින් කියා සිටියේ ඉංජිනේරු සහකාර මහතාගේ ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් අකමැත්ත , කණගාටුව ප්‍රකාශ කරන නමුත් එතුමාගේ ඉදිරි අනාගත අභිවෘද්ධිය සදහා යන බැවින් ඊට ආශිර්වාද කරමින් අනාගතයට සුභාශිංසනය ගෙන එන බවයි. |
| වාරි.ඉංජිනේරු | 2017/2018 මහ කන්නය 1,2 පියවර සදහා මාර්තු 17 දිනත් 3,4 පියවර සදහා මාර්තු 02 යන දිනයන්හි අවසන් ජල මුරය නිකුත් කිරීමට නියමිත බවත් 2018 යල කන්නය සදහා මහවැලි ජල පාලක කමිටු රැස්වීම් තීරණ අනුව ක්‍රියාත්මක වන බවත් මෙම කන්නය ඉතාමත් තීරණාත්මක කන්නක් බවත් ප්‍රකාශ කරන ලදී.<br>මිණිපේ ව්‍යාපාරයට 2018 වසර ස්වර්ණමය වසරක් වන බව පවසමින් කියා සිටියේ මෙම වසර තුළ මිණිපේ ව්‍යාපාරට ව්‍යාපෘති කිහිපයක්ම ලැබී ඇති බවයි. ලෝක බැංකු ආධාර මත ඇ.ඩො. 152ක් යටතේ බෙදුම් ඇල සංවර්ධනය කිරීමේ CRIP - දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය මෙම වර්ෂය තුළ ආරම්භ කර 2019 මාර්තු වන විට ව්‍යාපෘතියේ සියලු කටයුතු අවසන් කළයුතු බවත් එම වැඩසටහන යටතේ පියවර 4හිම සංවර්ධනය වන බෙදුම් ඇල පද්ධති හා ඒවා කුමන ආකාරයකින් සංවර්ධන කටයුතු සිදු කරන්නේ ද යන්න පිළිබදව දත්ත පදනම් කරගනිමින් විස්තරාත්මක පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.<br>එසේම PEISEIP ව්‍යාපෘතිය නමින් කෙත් ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ලැබී ඇති බවත් එය වසර 04ක කාලයක් තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් ප්‍රකාශ කරමින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම ගො.සං.විසින් ලබා දිය යුතු බව පවසන ලදී.<br>2018යල කන්නය පිළිබද අදහස් දකිවමින් කියා සිටියේ 2017/18 මහ කන්නයේ වගා කටයුතු කන්න තීරණ වලට අනුව ක්‍රියාත්මක කර නොමැති බැවින් මේ වන විට වගාවේ පවතින ස්වභාවය අනුවත් CRIP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති කාල සීමාවත් යන දෙක සංසන්දනාත්මකව බලන විට 2018 යල කන්න වැඩ කටයුතු පිළිබදව තීරණාත්මක අවස්ථාවක පවතින බවයි. එසේම මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ද සිදු කිරීමට නියමිත බව පෙන්වා දෙමින් මෙම සියළු කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබෙනුයේ නම් මිනිපේ ගොවි ජනතාවගේ ගැටළු විශාල ප්‍රමාණයකට විසදුම් ලැබෙන බවයි. එබැවින් ගොවි සංවිධාන විසින් ගණු ලබන තීන්දු තීරණ හෙට දවසේ අභිවෘද්ධිය වෙනුවෙන් ගතයුත්තක් බව වැඩි දුරටත් දන්වා සිටින ලදී. |

| | |
|---|---|
| රදුන්න වැව ගො.සං. සභාපති | ඉතා දීර්ඝ කාලයක සිට විවිධ ගැටළු රාශියක් පවතින තම ගො.සංවිධානයේ කිසිදු ඇලක් මෙම ව්‍යාපෘති කිසිවක් යටතේ සංවර්ධනය කිරීමට යොදා නොගැනීම පිළිබද ප්‍රශ්න කරමින් කියා සිටියේ කුමන ව්‍යාපෘතියක් ආවද ඒ කිසිදු ව්‍යාපෘතියකින් තමන් ඇතුලු ගොවීන්ගේ ගැටළු වලට විසදුම් නොලැබෙන්නේ නම් එම ව්‍යාපෘති වලින් කිසිදු ඵලයක් නොමැති බවයි. තමන් ඇතුලු ගොවීන්ට හැමදාමත් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වන බවත් විශේෂයෙන් වැව් 05 ගැටලු පිළිබද අදහස් දක්වමින් කියා සිටියේ වසර 61 ක් පුරාවටම මෙවර මාස් කන්නය හැරෙන්නට කිසිදු කන්නක් වර්ෂාව නොමැතිව සාර්ථකව වගා කටයුතු සිදු කිරීමට හැකියාවක් නොලැබුණ බවයි. එබැවින් වැව් 05 පිළිබද මීට වඩා නිලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බව පවසමින් තම ගො. සං. මුහුණපාන ගැටලු විසදා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. |
| නේ.ව්‍ය.කළමනාකරු | රදුන්න වැව සභාපතිතුමාගේ දුක් ගැනවිල්ලට අදහස් දක්වමින් කියා සිටියේ CRIP ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය නොකරන ඇලවල් ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත PEISEIP ව්‍යාපෘතිය හරහා සිදු කිරීමට කටයුතු යෙදිය හැකි බවයි. එබැවින් මෙම ව්‍යාපෘති හරහා ලැබෙන ප්‍රතිලාභ ලබා ගැනීමට සියලු ගො.සං. අවස්ථාව ලබා දිය යුතු බව පවසමින් 2018.03.06 දින යල් කන්න පිළිබද පෙර කන්න රැස්වීම පවත්වන බවත් එදිනට පියවරයන් 04හිම යල් කන්න පිළිබද තීන්දු තීරණ සහ කෙත් ඇල සම්බන්ධව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරගෙන එන ලෙසට දන්වා සිටින ලදී. |
| මහැවලි අධිකාරී කොට්ඨාස සහකාර මහතා | මෙම කලාපය මහවැලි E කලාපය ලෙස නම් කිරීමට නියමිත බවත් කැබිනට් අනුමැතිය ලැබුණ වහාම ඒ බව ගැසට් පත්‍රයක එල කිරීමෙන් අනතුරුව මහවැලි E කලාපය බවට පත් වන බව ප්‍රකාශ කරන ලදී. එසේම මහවැලි E කලාපයට සම්බන්ධව හසලක ප්‍රදේශයේ කාර්යාලක් ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇති බවද දන්වා සිටින ලදී.<br>මහවැලි E කලාපයක් බවට පත් කිරීමෙන් පසු මෙම ප්‍රදේශයේ ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබදව සදහන් කරමින් ,<br>• කෘෂිකාර්මික අංශය<br>• ආයතන සංවර්ධන අංශය<br>• ඉඩම් අංශය<br>• ගොඩනැගිලි සංවර්ධන අංශය<br>ආදී විවිධ ක්ෂේත්‍ර හරහා සංවර්ධන ක්‍රියාවලිය සිදු කරන බවත් එහි සියලු ප්‍රතිලාභ ඉතා කඩිනමින් මහජනතාවට ලබා දීමට 2018 ක්‍රියාකාත්මත සැලැස්මට (Action Plan) අනුව කටයුතු කරන බව වැඩි දුරටත් දන්වා සිටින ලදී. |
| සමස්ත ලංකා ඒකාබද්ධ ගො.සං. සභාපති ගමගේ මහතා | 1948 D.S. සේනානායක මහතා විසින් මිණිපේ ඉඩම් මහජන සතු කිරීමෙන් වාරිමාර්ග ව්‍යාපාරයක් බවට පත් කර අනතුරුව 1987 මෙම ප්‍රදේශය වනජීවී කලාපයක් බවට පත් කිරීමෙන් පසු මහා වාරිමාර්ග ව්‍යාපාරයක් බවට පත් කරන ලදී. එතැන් පටන් මිණිපේ ගොවිජනතාවගේ සියලු කෘෂිකාර්මික කටයුතු සිදු වූයේ වාරිමාර්ග දෙපාර්තාමේන්තුව, වාරි කළමනාකරණ අංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා බවත් එබැවින් වාරිමාර්ග කළමනාකරණ අංශයෙන් මිණිපේ ව්‍යාපාරය ගිලිහීමට ඉඩ නොදෙන බවත් දැඩිව ප්‍රකාශ කරමින් කියා සිටියේ සියලු ගොවි සංවිධාන වාරිමාර්ග කළමනාකරන අංශය යටතේ ඉදිරියේදී ක්‍රියාත්මක වන බවයි. |
| මහැවලි අධිකාරී කොට්ඨාස සහකාර මහතා | මේ වන විට යම් යම් ප්‍රදේශ මහවැලි කලාප ලෙස නම් කර ක්‍රියාත්මක වන නමුත් මෙම කලාපය මහවැලියට භාර ගැනීමක් නොව සියලු රාජ්‍ය ආයතන හා සම්බන්ධව කටයුතු කිරීමට මැදිහත් වීම පමණක් සිදු වන බව දන්වා සිටින ලදී. |
| නියෝජ්‍ය කෘෂි අධ්‍යක්ෂ,අන්තර් පළාත් | මේ වන විට ඉතා සාර්ථක වගාවක් ක්ෂේත්‍රය තුළින් දක්නට ලැබෙන බවත් යම් යම් හේතු මත වගාව ප්‍රමාද වී ඇති බවත් ඒ හේතුවෙන් ඉදිරියේ දී පළිබෝධ හානි ව්‍යාප්ත වීමේ ඉඩ ප්‍රස්ථා සුළභ වන බැවින් කෘෂි උපදේශක මහත්ම මහත්මීන්ගේ උපදෙස් ලබා ගැනීමට යොමු වන ලෙසත් දන්වා සිටින ලදී.<br>2018 යල කන්න පිළිබද අදහස් දක්වමින් මේ වන විට අප රට ආහාර හිගයකට මුහණ දී ඇති බැවින් මිණිපේ ව්‍යාපාරය තුළ වගා කටයුතු සිදු කිරීමට හැකියාව තිබියදී කන්න අතහැර දැමීම තුළින් සිදු වන්නේ මෙම ප්‍රශ්නය තවදුරටත් උග්‍ර කිරීමට දායක වීමත් බවයි. එබැවින් කිසිදු ව්‍යාපෘතියක් එල රහිත නොකර සංවර්ධන කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා ගන්නා සේම 2018 යල කන්න වගා කටයුතු සදහාද අවස්ථාව ලබා ගැනීම යහපත් වන බවයි.<br>කෙටි කාලීන බෝග වලට යාම ( මාස 03 වැනි වී ප්‍රභේද ) අතිරේක බෝග වගාවන් වලට යෑමට යොමු වන්නේනම් ජූලි මස වන විට ඇල සංවර්ධන කටයුතු වලට ද |

| | |
|---|---|
| | අවස්ථාව ලබා ගැනීමට හැකියාව ලැබෙන බව ප්‍රකාශ කරන ලදී. |
| වී අලෙවි මණ්ඩලය | මෙම වර්ෂයේ පටන් වී මිළදී ගැනීම් කටයුතු දිස්ත්‍රික් ලේකම්තුමන්ලා හරහා සිදු වන බව දැනුවත් කර ඇති බව දන්වා සිටිමින් මේ වන විට වී මිළදී ගැනීම සදහා හෙට්ටිපොල, හදුන්ගමුව වී ගබඩා 05ක් විවෘත කිරීමට කටයුතු කර ඇති බවත් මාර්තු15 වන විට හසලක වී ගබඩා විවෘත කිරීමට නියමිත බවත් ,<br>සම්බා වී 1 Kg ක් රු.41ක්<br>නාඩු වී 1 Kg ක් රු.38 ක් ලෙසත් මිලදී ගැනීමට කටයුතු යොදා ඇති බව දන්වා සිටින ලදී. |
| ප්‍රා.සංවර්ධන බැංකු කළමනාකරු | මිනිපේ ගොවි සංවිධාන දීර්ඝ කාලයක් පුරාවට තම බැංකුව සමග ගණුදෙනු කරන බවත් ඔවුනට සහන සැලසීමක් වශයෙන් කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ අරමුණින් 7%ක පොළී පදනම මත ණය ලබා දීමට “රන් කෙත” නමින් ගොවි උපකරණ සදහා සහන ණය යෝජනා ක්‍රමයක් හදුන්වා දෙන බවත් “ගොවි නවෝදා” නමින් සහන ණය ක්‍රමයක් හදුන්වා දෙන බවත්, වනිතාවන් සදහා 4%ක පොළී අනුපාතිනයට යටත්ව උපරිම රුපියල් ලක්ෂයක ණය මුදලක් කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ලබා ගත හැකි බවත් දන්වා සිටින ලදී. |
| ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී - හෙට්ටිපොල | 2017/18 මාස් කන්නය තුළ පොහොර සම්බන්ධව විවිධ ගැටලු පැවති නගින නමුත් එක් ගොවියකු සදහා පොහොර මිටි 2 බැගින් හෝ ලබා දීමට කටයුතු කළ බවද ඉදිරි කන්න සදහා පොහොර මුදල් ලබා දීමට අවැසි කටයුතු කරන බවත් අනෙකුත් බැංකු වලට සාපේක්ෂව ඉතා අඩු පොළියක් යටතේ ගොවීන්ට සහන ලබා දීමට ගොවි බැංකුව හරහා කටයුතු යොදා ඇති බවත් දන්වා සිටිමින් ගියවර හෙට්ටිපොල ගොවි බැංකුව මගින් රු. ලක්ෂ 20ක ණය මුදලක් ලබා දුන් බවත් ඉදිරියේදී එම කටයුතු සාර්ථකව සිදු කිරීමට කටයුතු යොදන බවත් පවසන ලදී. |
| 4 පියවර ප්‍රා.ගො.සං. සභාපති රංජිත් මහතා | මිණිපේ ව්‍යාපාරය තුළ 95%ටත් වඩා කන්න තීරණ ක්‍රියාත්මක කරන එකම පියවර 4 පියවර බවත් මේ වන විට 4 පියවර තුළ ගොයම් කැපෙන මට්ටමේ වගාව පවතින බව ප්‍රකාශ කරන ලදී. දැනට රට තුළ වී මිළ රු.28 දක්වා පහළ බැස ඇති බව දන්වා සිටිමින් කියා සිටියේ නිසි වේලාවට පොහොර නොලැබුණ නිසා වගාව එහිදී අසාර්ථක වූ බවත් බේරාගත් අස්වැන්න සදහාවත් හොද මිළක් නොමැති වීම නිසා ගොවි ජනතාවට අතින් පාඩු විදීමට සිදුව ඇති බවත් පෙන්වා දෙන ලදී. එබැවින් අවම වශයෙන් වී 1 Kg මිළ රු.50 දක්වා ස්ථාවර කළ යුතු බවත් එසේ නොවුණහොත් ඉදිරියේදී සටන් පාඨ සහිතව උද්ඝෝෂණ පවා ක්‍රියාක්මක කිරීමට සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී.<br>2018 යල කන්න පිළිබද අදහස් දක්වමින් කියා සිටියේ කන්න තීරණ අනුව වගා කටයුතු සිදු කරන 4 පියවරට ජලය අවශ්‍ය බවත් මාර්තු 15ත් 20ත් අතර දිනයක ප්‍රථම ජල මුරය අවශ්‍ය බවත් අප්‍රේල් 10වන විට වගා කටයුතු සිදු කර අවසන් කරන බවත් ජූලි 20න් පසු CRIP ව්‍යාපෘතිය සදහා අවස්ථාව ලබා දීමට හැකියාව ඇති බවත් ප්‍රකාශ කරන ලදී.<br>මිණිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දක්වමින් 4 පියවර ගාමිණි කොන්ත්‍රාත් සමාගමට 4 පියවර සියලු ගොවි සංවිධාන වෙනුවෙන් ස්තූතිය එල කරන බවත් එම කටයුතු ඉතා සාර්ථකව සිදු කර ඇති බවත් ඉදිරි සංවර්ධන වැඩ කටයුතු සියල්ල එසේ සාර්ථක අන්දමින් සිදු කරන ලෙසත් ස්තූති පූර්වකව ප්‍රකාශ කරන ලදී.<br>වැව් 05 ප්‍රශ්න පිළිබද අදහස් දක්වමින් කියා සිටියේ මේ වන විට මෙම වැව් සියල්ලේ රොන් මඩ පිරී ඇති බැවින් දින 03කටවත් ප්‍රමාණවත් ජලය රදවා තබා ගැනීමට නොහැකි බැවින් එම වැව්වල රොන් මඩ ඉවත් කර ප්‍රමිතියෙන් යුතුව පිළිසකර කර දෙන ලෙසයි. මිනිපේ අමුණ ඉස්සීමේ ව්‍යාපෘතියට සම්බන්ධ අදහස් දක්වමින් විල්ගමුවෙන් සම්බන්ධ වන කුඹුරු කාණුවල අපවිත්‍ර ජලය ප්‍රතිචක්‍රීකරණය කර ප්‍රධාන ඇලට යොමු කරන ලෙස යෝජනා කළ අතර 4 පියවර D3 ගො.සං. සභාපතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී... |
| 3 පියවර ප්‍රා.ගො.සං. සභාපති | මිණිපේ අමුණ ඉස්සීමෙ ව්‍යාපෘතිය පිළිබද අදහස් දක්වමින් නවලෝක කොන්ත්‍රාත් සමාගම ඉතාම මන්දගාමී ස්වරූපයකින් වැඩ කටයුතු සිදු කරන බවත් එහි වැඩ කටයුතු පිළිබද කිසිදු පැහැදීමක් නොමැති බවත් ප්‍රකාශ කරමින් ඉදිරි කාල සීමාව තුළදීත් මෙම සංවර්ධන කටයුතු මන්දගාමී අයුරින්ම සිදු කරන්නේ නම් 3 පියවරට අදාළ සංවර්ධන |

| | |
|---|---|
| | කටයුතු කෙදිනක නිම කිරීමට හැකියාව ලැබෙන්නේද ඊට ගනු ලබන ක්‍රියා මාර්ග කුමක්ද යන්න විමසා සිටින ලදී. කොන්ත්‍රාත් සමාගමට අවශ්‍ය පරිදි සංවර්ධන කටයුතු සිදු කරන්නේනම් ව්‍යාපෘති අධ්‍යක්ෂ, අනෙකුත් රාජ්‍ය නිලධාරීන් ඇතුලු දුක් ගැනවිලි කමිටු ආදියෙන් ඵලක් නොමැති බව වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින ලදී.<br>2018 යල කන්නය පිලිබද අදහස් දක්වමින් කියා සිටියේ 2017/18 මහ කන්නය සදහා අවශ්‍ය කලට පොහොර නොලැබුණ බැවින් යම්තාක් දුරකට වගාවන් අසාර්ථක වූ බවත් අවසානයේ ගණු ලබන අස්වැන්නට නිසි මිළක් නොමැති වීම තුළින් ගොවි ජනතාව අපහසුතාවයට පත්වන බවයි.<br>CRIP, PEISEIP ව්‍යාපාති සම්බන්ධ අදහස් දක්වමින් මෙවැනි සංවර්ධන කටයුතු මිණිපේ ව්‍යාපාරයට ලැබුණේ වසර ගණනාවකින් බැවින් එම සංවර්ධන කටයුතු වලට මුල් තැන දී ක්‍රියාකළ යුතු කාලය එළඹ ඇති බව දන්වා සිටින ලදී. 2018 යල කන්නය තුළින් මෙම ව්‍යාපෘතිය සදහා අවස්ථාව ලබා දී මිණිපේ ව්‍යාපාරයේ පවතින ගැටලු වලට විසදුම් ලබා ගැනීමට මූලිකව කටයුතු කළයුත්තේ ගොවි සංවිධාන විසින් බැවින් එම අවස්ථාව සලසා දීම සුදුසු බවත් 3 පියවර 2018 යල කන්නය අතහැර හෝ CRIP ව්‍යාපෘතියට අවස්ථාව ලබා දීමට සූදානම් බවත් , නමුත් 1,2,4 පියවර සදහා යල් කන්නයක් ක්‍රියාත්මක කරන්නේනම් 3 පියවරට ද ජලය ලබා දෙන ලෙසත් අදාල කලට වේලාවට වගා කටයුතු සිදු කිරීමට සූදානම් වන බවත් පවසා සිටින ලදී. |
| 2 පියවර ප්‍රා.ගො.සං. සභාපති ගමගේ මහතා | 2018 යල කන්නය පිලිබද අදහස් දක්වමින් කියා සිටියේ 2 පියවර ප්‍රා.ගො.සං. රැස්වීම පසු ගිය දිනක පැවැත්වූ බවත් එහිදී ගණු ලැබූ තීරණ ලෙස අප්‍රේල් 01 පළමු ජල මුරය නිකුත් කිරීම සුදුසු බවත් ජුලි මස වන විට වගා කටයුතු අවසන් කිරීමේ හැකියාව ඇති බවත් එතැන් පටන් සංවර්ධන කටයුතු වලට අවස්ථාව ලබා දිය හැකි බවත් දන්වා සිටිමින් ප්‍රකාශ කළේ 1,2,3,4 පියවර තුළ තෝරාගත් බෙදුම් ඇලවල් කිහිපයක් පමණක් CRIP ව්‍යාපෘතිය හරහා සංවර්ධනය වන විට බහුතරයක් බෙදුම් ඇල ගොවි මහතුන් කිසිදු සංවර්ධන කටයුත්තක් හෝ සිදු නොවෙමින් යල් කන්න වගා කටයුතුද අතහැර බලා සිටීම නිශ්ඵල ක්‍රියාවක් බවයි. මේ වන විට වී මිළ රු28 දක්වා පහළ ඇති බවත් පිටරටින් හාල් මෙට්‍රික්ටොන් ගණන් විශාල මුදගලක් වියදම් කරමින් ගෙන්වන නමුත් මෙරට ගොවියාගේ අස්වැන්න සාධාරණ මිළකට ගැනීම කිසිදු ආකාරයක ප්‍රතිපත්තියත් නොමැති වීම ලාංකික ගොවිජනතාවට කරනු ලබන මහත් අසාධාරණයක් බවයි. වර්ථමානය වනවිට 86ලක්ෂයක ගොවිජනතාව විවිධ වූ අපහසුතාවයන්ට අසාධාරණයන්ට ලක්ව සිටින බව පෙන්වා දෙන ලදී.<br>වන වගාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියේ වන වගාවන් ස්ථාපිත කිරීමේදී එම වගාවන් ජන ජීවිත වලට කිසිදු ආකාරයකින් හානියක් නොවිය යුතු බවයි. මේ වන විට යම් යම් වන වගාවන් හේතුවෙන් ජන ජීවිත අවදානම් තත්වයන්ට මුහුණ දී ඇති බවත් ඉදිරියේදී කරනු ලබන සංවර්ධන කටයුතු සමග රක්ෂිත වෙන් කිරීමේ කටයුතුද සිදු වන්නේ නම් එය යහපත් කටයුත්තක් බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. |
| 1 පියවර ප්‍රා.ගො.සං. සභාපති සරත් මහතා | 1 පියවර. ප්‍රා.ගො.සං. රැසවීම පැවැත්වූ බවත් එහිදී CRIP ව්‍යාපෘතිය පිළිබද ගොවි සංවිධාන දැනුවත් කළ බවත් එහිදී ඒකමතිකව 1 පියවර 2018 යල කන්නය අතහැර හෝ එම සංවර්ධන ව්‍යාපෘතියට අවස්ථාව ලබා දීමට යෝජනා ස්ථිර වූ බැවින් යල කන්නය සදහා මේ අවස්ථාවේදී කිසිවක් ප්‍රකාශ කළ නොහැකි බවත් පෙර කන්න රැස්වීමේදී ඒ පිලිබද අදහස් දැක්වීමට සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී. |
| වී පිළිබද විෂයභාර නිලධාරි මුතුබණ්ඩා මහතා | තමා විශ්‍රාම යාමට පෙර සම්බන්ධ වන අවසන් ව්‍යාපාර කමිටු රැස්වීම බවත් මිණිපේ ව්‍යාපාරය තුළ සේවය කිරීමට ලැබීම සතුටට හේතුවක් බවත් ඉදිරියේදී නිළවශයෙන් නොවුණත් පුද්ගලිකව හෝ තමන් ලද දැනුම මිණිපේ ගොවි ජනතාවට ලබා දීමට සූදානම් බව ප්‍රකාශ කරමින් කියා සිටියේ කීඩෑ හානිය මේ වන විට රට පුරා පැතිර යන බැවින් ඒ පිළිබද දැඩි අවධානය යොමු කරන ලෙසයි. පැල මැක්කා,කොළ හකුළන දළඹුවා, දුඹුරු පැළ කීඩෑවා ආදී පළිබෝධ පිළිබද අවධානයෙන් සිට අදාළ පළිබෝධ නාශක යෙදීමට යොමු වන ලෙසත් දන්වා සිටින ලදී. |
| නේ.ව්‍යා.කළමණා කාරතුමා | වසර 35ක් පමණ කාලයක් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සේවය කරමින් වී පිළිබද විෂයභාර නිලධාරි මුතුබණ්ඩා මහතා ලද දැනුම ඉදිරියේදී ලබා ගැනීමට සූදානම් බවත් ප්‍රකාශ කරමින් එතුමාට සතුටපිරි විශ්‍රාම දිවියකට සුභාශිංසණ ගෙන එන ලදී. |
| ව්‍යා. කමිටු ලේකම් ධර්මසේන මහතා | ව්‍යාපාර කමිටු රැස්වීමට සහභාගී වූ සියලු රාජ්‍ය නිලධාරීන්ටත් බැංකු හා වෙනත් ආයතන වලින් පැමිණි නිලධාරීන්ටත් සියලුම ගොවි සංවිධාන නිලධාරීන්ටත් ස්තූතිය ප්‍රකාශ කරමින් ව්‍යාපාර කමිටු රැස්වීම් කටයුතු අවසන් කරන ලදී. |

එම්. ඒ. බී. බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය
නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය
මොරයාය, මිනිපේ